# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ භාවිතයෙන් පසු අයෝග්‍ය කරන ලද පහත සඳහන් රථ වාහන/පොදු භාණ්ඩ ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් විකිණීමට ඉදිරිපත් කෙරේ

**ටෙන්ඩර් ක්‍රියාවලිය පිලිබඳ විස්තර හා අදාල ටෙන්ඩර් කොන්දේසි**

1. ටෙන්ඩර් කාලසටහන

| ස්ථානය | වාහන/පොදු භාණ්ඩ | රථ වාහන/පොදු භාණ්ඩ ලොට් අංක | අයදුම්පත් ඉදිරිපත් කලහැකි කාලසීමාව | ටෙන්ඩරය විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | ට්‍රක් රථ, බස් රථ, ට්‍රැක්ටර් රථ, ට්‍රැක්ටර් ටේලර්, බවුසර් ටේලර්, ලෑන්ඩ් කෲෂර් රථ, පූසෝ කසල රථය, ඩබල් කැබ් රථ, ජීප් රථ, ත්‍රිරෝද රථ, ධාවන පැදි සහ පොදු භාණ්ඩ | 01 සිට 57 දක්වා (වාහන) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.20 දින 1000 පැය දක්වා | 2025.01.20 දින 1030 පැයට |
| | | 01 සිට 27 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.21 දින 1000 පැය දක්වා | 2025.01.21 දින 1030 පැයට |
| 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | ට්‍රක් රථ, බස් රථ, ජල බවුසර් රථ, ට්‍රැක්ටර් ටේලර්, බවුසර් ටේලර්, අත් ට්‍රැක්ටර් රථ/ටේලර් ප්‍රයිම්මූවර් රථ, ධාවන පැදි සහ පොදු භාණ්ඩ | 01 සිට 25 දක්වා (වාහන)<br>01 සිට 22 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.16 දින 1000 පැය දක්වා | 2025.01.16 දින 1030 පැයට |
| 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | ට්‍රක් රථ, ජල බවුසර් රථ, ට්‍රැක්ටර් රථ, බවුසර් ටේලර්, අත් ට්‍රැක්ටර් රථ, ධාවන පැදි සහ පොදු භාණ්ඩ | 01 සිට 16 දක්වා (වාහන)<br>01 සිට 14 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.17 දින 1000 පැය දක්වා | 2025.01.17 දින 1030 පැයට |
| 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, පලාලි | ට්‍රැක්ටර් රථ, බවුසර් ටේලර්, බවුසර් රථ, බස් රථ, කැබ් රථ, ගිලන් රථ, ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි සහ පොදු භාණ්ඩ | 01 සිට 15 දක්වා (වාහන)<br>01 සිට 15 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.07 දින 1000 පැය දක්වා | 2025.01.07 දින 1030 පැයට |
| 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, කොකාවිල්, කිලිනොච්චිය | ට්‍රක් රථ, ට්‍රැක්ටර් රථ, බවුසර් ටේලර්, කැබ් රථ, ධාවන පැදි සහ පොදු භාණ්ඩ | 01 සිට 12 දක්වා (වාහන)<br>01 සිට 13 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.08 දින 1000 පැය දක්වා | 2025.01.08 දින 1030 පැයට |
| ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණය, යුද්ධ හමුදා කඳවුර, නන්දිකඩාල්, මුලතිව් | ට්‍රක් රථ, අත් ට්‍රැක්ටර් රථ, බවුසර් ටේලර්, කැබ් රථ, ත්‍රිරෝද රථ, ධාවන පැදි සහ පොදු භාණ්ඩ | 01 සිට 12 දක්වා (වාහන)<br>01 සිට 15 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2025.01.09 දින 1000 පැය දක්වා | 2025.01.09 දින 1030 පැයට |
| 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු (මත්තේගොඩ)<br>යුද්ධ හමුදා කඳවුර, මත්තේගොඩ, පොල්ගස්ඕවිට | පොදු භාණ්ඩ - ඉඩම් වාහන අමතර කොටස් හා අබලි ලෝහ ද්‍රව්‍ය (යකඩ, ඇලුමිනියම් ආදිය) | 01 සිට 06 දක්වා (පොදු භාණ්ඩ) | 2024.12.09 දින 0900 පැයේ සිට<br>2024.12.30 දින 1000 පැය දක්වා | 2024.12.30 දින 1030 පැයට |

2. **ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා ඉදිරිපත්කර ඇති වාහන/පොදු භාණ්ඩ පරීක්‍ෂා කිරීම හා අයදුම්පත් ලබාගත හැකි කාලසීමාව වනුයේ 2024.12.09 දින 0900 පැයේ සිට 2024.12.27 දින 1500 පැය දක්වා වේ. (සති අන්ත හා රජයේ නිවාඩු දින හැර)**

3. **ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා අසාදු ලේඛණ ගතකර ඇති අයවළුන් හට ඉදිරිපත් විය නොහැ**

4. ටෙන්ඩර් අයදුම්පත් අදාල වාහන/පොදු භාණ්ඩ එක්රැස්කර ඇති භූමියේ ස්ථාපිත කර ඇති කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් අයදුම්පත් සඳහා **එක් ලොට් එකක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු: 500/= (රුපියල් පන්සියක) මුදලක්** අය කරන අතර එම මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් අවශ්‍ය ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැක. වාහන/පොදු භාණ්ඩ සඳහා වෙන වෙනම ටෙන්ඩර් අයදුම්පත් ලබාගත යුතුවේ. (වාහන අයදුම්පතක් මගින් පොදු භාණ්ඩ සඳහා මිලගණන් ඉදිරිපත් කල නොහැක) **එක් ගැණුම්කරුවෙකු ලොට් කිහිපයකට මිලගණන් ඉදිරිපත් කරන්නේනම් ඒ සඳහා වෙන වෙනම ටෙන්ඩර් අයදුම්පත් මිලදී ගත යුතු අතර, එක් ටෙන්ඩර් අයදුම්පතකින් ඉදිරිපත් කල හැක්කේ එක් ලොට් අංකයකට අදාල මිලගණන් පමණකි. එසේ නොමැති ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

5. **වාහන සහ පොදු භාණ්ඩ සඳහා අදාළ වන ඇප තැන්පතු (ආපසු ගෙවනු ලබන) ප්‍රමාණයන් ඇතුලත් වගුවක් වාහන/පොදු භාණ්ඩ අයදුම්පතෙහි ඇතුලත්වේ. ඒ අනුව සෑම වාහන/පොදු භාණ්ඩ ලොට් එකක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඇප තැන්පතු** ඉදිරිපත් කළ යුතු අතර එම ඇප මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු ලැබෙන කුවිතාන්සිය (මුල් පිටපත) අනිවාර්යෙන්ම අදාළ අයදුම්පත සමග අමුණා ඉදිරිපත්කල යුතුය. **ඇප කුවිතාන්සිය ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

6. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී රථ වාහන/පොදු භාණ්ඩවල ඉදිරියේ සටහන් කර ඇති ලොට් අංකය අනිවාර්යෙන්ම අයදුම්පතෙහි හා අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ පහත සඳහන් අයුරින් සටහන් කල යුතුය.

**අ. ලොට් අංකය : ………………  ආ. ටෙන්ඩරය විවෘත කරන දිනය : 2025/… /……… දින  ඇ. වර්ගය (වාහන/පොදු භාණ්ඩ) : …………………………**

7. ටෙන්ඩර් පෙට්ටි තබා ඇති ස්ථානය හා **අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් එවිය යුතු ලිපිනයන් පහත දක්වා ඇත.** රථ වාහන/පොදු භාණ්ඩ සඳහා වෙන වෙනම පෙට්ටි වෙන්කර තබා ඇති අතර එම පෙට්ටි සතියේ වැඩ කරන දිනවල (සති අන්ත හා රජයේ නිවාඩු දිනවල හැර) උදෑසන 0900 පැයේ සිට 1600 පැය දක්වා නියෝජිතයෙකු භාරයේ පහත දක්වා ඇති ස්ථානයන්හී තබා ඇත. **අයදුම්පත් පෙට්ටිවලට බහාලීමට ප්‍රථම එම ස්ථානයේ සිටින නියෝජිත භාරයේ තබා ඇති රෙජිස්ටරයේ ලේඛණගතකර අදාල පෙට්ටියට බහාලිය යුතුය. වාහන අයදුම්පත් වාහන පෙට්ටියටද, පොදු භාණ්ඩ අයදුම්පත් පොදු භාණ්ඩ පෙට්ටියටද බහාලිය යුතු අතර, අදාළ නොවන පෙට්ටියකට බහාලන ලද අයදුම්පත් ප්‍රතික්ශේපිත අයදුම්පත්සේ සලකනු ලබයි.**

| ස්ථානය | ටෙන්ඩර් පෙට්ටි තබා ඇති ස්ථානය | අයදුම්පත් එවිය යුතු තැපැල් ලිපිනය | ටෙන්ඩරය විවෘත කරනු ලබන ස්ථානය |
|---|---|---|---|
| 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | ආරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර)<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම<br>(ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය,<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | බෝධිරාජාරාමය<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම |
| 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | **2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය (ප්‍රධාන දොරටුව අසල)**<br>**පොදු භාණ්ඩ පරීක්‍ෂා කලහැකි ස්ථානය** - මධ්‍යම භාණ්ඩාගාර අංශය කඳවුරු භූමිය වහමල්ගොල්ලෑව (මැදවච්චිය)<br>**ලොට් අංක 24, 26 ට අදාල ප්‍රයිම්මූවර් රථ පරීක්‍ෂා කළහැකි ස්ථානය** - සන්නද්ධ බලකා පුහුණු මධ්‍යස්ථානය, කවරක්කුලම, ගල්කුලම, අනුරාධපුරය<br>ලොට් අංක 25 ට අදාල ප්‍රයිම්මූවර් රථය පරීක්‍ෂා කළහැකි ස්ථානය - වියාඉ සන්නද්ධ බළඇණිය, යුහ කඳවුර, සාලියපුර, අනුරාධපුරය | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය,<br>යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුරය | 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර |
| 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>(ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය,<br>යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය |
| 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, පලාලි | මුලස්ථානය, ආරක්‍ෂක සේනාව යාපනය<br>යුද්ධ හමුදා කඳවුර, වාසවිලාන්, පලාලි<br>(ප්‍රධාන දොරටුව අසල) (කඩ්ඩුවාන්) | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>**5** වන රෙජිමේන්තුව<br>ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, වාසවිලාන්, පලාලි | 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, පලාලි |
| 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, කොකාවිල්, කිලිනොච්චිය | 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>(ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, කොකාවිල්, කිලිනොච්චිය | 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, කොකාවිල්, කිලිනොච්චිය |
| ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණය, යුද්ධ හමුදා කඳවුර, නන්දිකඩාල්, මුලතිව් | ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණය<br>(ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණය<br>යුද්ධ හමුදා කඳවුර, නන්දිකඩාල්, මුලතිව් | ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණය<br>යුද්ධ හමුදා කඳවුර, නන්දිකඩාල්, මුලතිව් |
| 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු (මත්තේගොඩ)<br>යුද්ධ හමුදා කඳවුර, මත්තේගොඩ, පොල්ගස්ඕවිට | 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු (මත්තේගොඩ)<br>(ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු (මත්තේගොඩ)<br>යුද්ධ හමුදා කඳවුර, මත්තේගොඩ, පොල්ගස්ඕවිට | බෝධිරාජාරාමය<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම |

8. සෑම අයදුම්පතක්ම නිසි අයුරු සම්පූර්ණ කර කවරයක බහා ඉහත 7 වන ඡේදයේ සඳහන් ස්ථානයේ තබා ඇති නිවැරදි පෙට්ටිවලට නියමිත දින හා වේලාවට ප්‍රථම බහාලීමට හෝ නියමිත දිනට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතුය. **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසු ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

9. **අයදුම්පත් විවෘත කරන අවස්ථාව සඳහා අනන්‍යතාව සහතික කල හැකි ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය සහිතව ගැණුම්කරු** හෝ **ගැණුම්කරු සහභාගි නොවන්නේ නම් ඔහු වෙනුවට බලය පවරන ලද නීත්‍යානුකූල ලිපියක් සහිතව නියෝජිතයෙකු අනිවාර්යෙන්ම සහභාගි කරවීමට** ක්‍රියාකළ යුතුය.

10. **සැලකිය යුතු කරුණු :**

අ. තීරු බද්දෙන් නිදහස් වාහන සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති වාහන මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් අදාළ වාහනය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරගැනීමේදි අදාළ වන තීරු බදු මුදල් එම දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කළ යුතු අතර එම වාහන පිළිබඳ විස්තර අදාළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය වෙතින් දැනුම් දෙනු ඇත.

**ආ. සුන්බුන් වාහන හැර අනෙකුත් වාහන මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් එම වාහන කඳවුරු භූමිය තුලින් ඉවත්කර ගැනීමට ප්‍රථම අදාල කඳවුරේ නියෝජිතයන් විසින් ලබාදෙන ලියකියවිලි සමඟ වාහනයේ චැසි/එන්ජින් අංක නිවැරදිව ඇති බවට තහවුරුකර ගැනීමෙන් අනතුරුව වාහන ඉවත්කර ගත යුතුය. (කඳවුරු භූමිය තුලින් වාහන ඉවත්කර ගත් පසු ඇතිවන ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වගකියනු නොලැබේ)**

**ඇ. පොදු භාණ්ඩ ලොට් අංකයන් සඳහා ඇතුලත් කර ඇති භාණ්ඩ පිළිබඳ විස්තරයක් ටෙන්ඩර් අයදුම්පත්‍රය සමඟ නිකුත් කරනු ලැබේ.**

11. ටෙන්ඩර් ක්‍රියාවලිය සම්බන්ධව ඉහත සඳහන් කොන්දේසි හා අයදුම්පත්වල දක්වා ඇති කොන්දේසි හොඳින් කියවා බලා තේරුම් ගෙන ඒවාට අනුකූලව ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකිරීම අයදුම්කරුවන් සතු වගකීම බව අවධාරණය කරන අතර ටෙන්ඩරය පිළිබඳ අවසාන තිරණය ටෙන්ඩර් මණ්ඩල සභාපති සතුවේ. මේ පිළිබඳ වැඩි විස්තර සතියේ වැඩකරන දිනයන්හීදී රාජකාරි කාලසීමාවන් තුල යුද්ධ හමුදා මුලස්ථානයේ දුරකථන අංක: 011-2987525 වෙතින් හා යුද්ධ හමුදා වෙබ් අඩවියෙන් (www.army.lk) ලබාගත හැක.

යුද්ධ හමුදාධිපති